# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2139/54 - 2019 සැප්තැම්බර් මස 04 වැනි බදාදා - 2019.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහාගාල්ල III වන අදියර ජල යෝජනා ක්‍රමය යටතේ ඝන මීටර් 225 ක ධාරිතාවයකින් යුත් ජල තටාකයක් හා පොම්පාගාරයක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම්, ජල සම්පාදන සහ<br>
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 29 වැනි දින,<br>
අංක 35, ලක්දිය මැදුර,<br>
නව පාර්ලිමේන්තු පාර,<br>
පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1475

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 109 F, ඉහළගොඩ ජනපදය ග්‍රාම නිලධාරී වසමේ ඉහළගොඩ ගමේ පිහිටි වවුළුගලගොඩ පර්චස් 15 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. පී. කුසුමාවතී මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | ගම්මානයට යන පාර ; |
| *දකුණට* | : | පැරණි ප්‍රාදේශීය සභා පාර ; |
| *බටහිරට* | : | කේ. පී. කුසුමාවතී මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : කේ. පී. කුසුමාවතී මිය,<br>
295, ප්‍රාදේශීය සභා පාර,<br>
පින්නදූව,<br>
වලහන්දූව.

09 - 633

1A - G 30902 — 39 (2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඌරගස්මන් හන්දිය ජල සම්පාදන ක්‍රමය යටතේ භූගත ජල තටාකය හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම්, ජල සම්පාදන සහ<br>
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 29 වැනි දින,<br>
අංක 35, ලක්දිය මැදුර,<br>
නව පාර්ලිමේන්තු පාර,<br>
පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1476

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 16 D, නානතොට ග්‍රාම නිලධාරී වසමේ නානතොට ගමේ පිහිටි මෙලෙක්කුවෙල අද්දර නැමති ඉඩමේ මැද බිම් කැබැල්ල නම්වූ යුනෙස්කෝ ගම්මාන බිම් කට්ටි සැලැස්මේ කැබලි අංක : 53 හි බටහිර මායිම දෙසට වන්නට පිහිටි පර්චස් 5 ක් පමණ වන පහත මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ගම්මානයට යන පාර සහ අංක : 47 නිවාස ඉඩම ; |
| *නැගෙනහිරට* | : | කඩ පේලිය. (අංක : 53 කැබැල්ලේ ඉතිරි කොටස) ; |
| *දකුණට* | : | හිමිකරුවකු නොදන්නා එළවළු වගා බිම ; |
| *බටහිරට* | : | යුනෙස්කෝ ගම්මානයට යන පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. පූජ්‍ය අහුන්ගල්ලේ විමලධම්ම තිස්ස හිමිපාණන්,<br>
සම සභාපති,<br>
ෆියුචර් විල්රන්ස් පදනම,<br>
නානතොට,<br>
කොස්ගොඩ.

09 - 634

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.